# Project 320

## 320 වන ව්‍යාපෘතිය




DP EDUCATION


Coding School

thunkable





LIVEWORKSHEETS

- To Do List App එකක් නිර්මාණය කරමු.
- මුලින්ම Thunkable.com වෙත පිවිස  new Project එකක් සදා ගන්න.
- පළමුවෙන්ම App එකෙහි screen එක design කර ගනිමු.
- ඒ සඳහා screen1 select කර එහි ඇති Background  Color මගින් පසුබිමට ඔබ කැමති වර්ණය හෝ ඔබ කැමති Background Image එකක් තෝරාගන්න.
- ඉන් පසුව Add Component හි ඇති Lable එක ගෙන ගොස් screen එක මත තබන්න.




- ඉන් පසු එහි Text එක To Do List ලෙස ලබා දී font size එක 40 ලෙසද, color එක ලෙස red වර්ණයද ලබා දෙන්න.font style එක italic ලෙසත් Font Weight එක Bold ලෙසත් ලබා දෙන්න.
- ඉන්පසු පහත දැක්වෙන පරිදි margin සහ border ලබා දෙන්න.





LIVEWORKSHEETS

- ඉන් පසු add කර ගත් lable එකට පහලින් Add Component හි ඇති column componenet දෙකක් add කර ගන්න. (column1 & column2)
- එලෙස add කර ගත් column1 හි Vertical Alignment සහ Horizontal Alignment පහත පරිදි සකසා ගන්න.




- පසුව lable එකක්, Text input එකක් සහ Button එකක් column1 තුලට එක් කර ගන්න.
- ඒවා Lable_heading, Text_Input සහ Add_Buttonලෙස rename කර ගන්න.




- Text_Input hint එක සඳහා Enter Task ලෙස Add_Button හි text සඳහා add ලබා දෙන්න.
- පසුව පහත රූපයෙ පරිදි Margine සකසා ගන්න. එලෙස column1 සකසා අවසන් කර ගන්න.




LIVEWORKSHEETS


❖ ඉහත add කර ගත් column2 හි alignment පහත් ආකාරයට සකස් කරගන්න.




❖ දැන් පෙර ලෙසම column2 තුලට පහත පරිදි නම් කර ගත් lable එකක් සහ Simple list එකක් කර ගන්න. ඒවා පහත රූපයෙ ආකාරයට rename කර ගන්න.





❖ Sub_heading එක සඳහා---Things To Do--- ලෙස ලබා දෙන්න.




LIVEWORKSHEETS


- දැන් ඔබ App එකෙහි design එක සාර්ථකව සාදා අවසන් කර ඇත.
- දැන් Blocks තුලට ගොස් coding කොටස නිර්මාණය කරගමු.
- මුලින්ම අපි, count(taskCounter) එක ගණන් කිරීමට හා list(taskList) එක assign කිරීමට variables සදා ගත යුතුයි. ඒ සඳහා variable යටතේ ඇති පහත code block එක ලබා දෙන්න.




- දැන් Button එක click කල විට සිදුවිය යුතු සියල්ල when-do block එක තුලට ඇතුල් කරන්න.

- Control කොටසේ ඇති if-do block එකක් drag කර එයට logic වෙත ගොස් අසමාන ලකුණ ඇති block එක drag කරන්න.

- Task එකක් add කරන්න පෙර, **Text Input** එකේ කුමනද හෝ විස්තරයක් type කර තිබේද කියලා පරීක්ෂා කල යුතුය. **Text Input** එක හිස් නම්, task එකක් එකතු නොවිය යුතුය.
- **ඉහත condition එක සපුරා ලීම** සඳහා එහි වම් පසට text_input හි පහත දක්වා ඇති block එක drag කරන්න.




- ඔබ **Add Button** එක **Click** කරන විට, **taskCounter** එකට 1 එකතු විය යුතුය.




- ඒ සඳහා මේ block එක ඇතුලතට, **set app variable to** block එක drag කරන්න.

LIVEWORKSHEETS

- නව අගය **taskCounter + 1** ලෙස සකසන්න.
- මෙතනදී, ඔබ add කරන සෑම කාර්යකකටම (task) **counter** එක +1 එකකින් වැඩිවේවි.
- නව task එක **taskList** එකට එකේ අවසානයට එකතු වීම් සඳහා පහත block එක යොදන්න.




- **app variable taskCounter:** මෙය වර්තමාන task අංකය පෙන්වයි.

- Task එක list එකට එකතු වූ විට, List Viewer එක update විය යුතුය.
- ඒ සඳහා **set Task_List's text items to taskList** block එක drag කරන්න





- Text_Input එක clear කර, ඊළඟ Task එක type කල හැකි ලෙස සකසන්න.




- **මුලිකවම task එකක් add කරන කොටස් කර අවසන්.**


- **දැන් අපි එම add කරපු task, delete කරන විදිය බලමු.**

- Task එක clicked කරද්දී, **remove list item block** එක use කරලා, list එකෙන් Task එක remove වෙන ලෙස සකසමු..




LIVEWORKSHEETS

❖ ඉහත දක්වා ඇති පරිදි ඔබ block,drag කර ඇත් නම්,පහත ලෙසින් තිබිය යුතුය.




LIVEWORKSHEETS